#mediaethicsSL #SinhalaPress #lka #Lankadeepa
පුවත්පත් තුළ පුවත් හෝ විශේෂාංග පළ කිරීමේදී පාඨකයාව ආකර්ෂණය කොටගත හැකි අන්දමේ සිරස්තල භාවිතා කිරීම බහුලව දැකිය හැකි අතර, එය කිසිසේත්ම ගැටළුකාරී නොවේ. කෙසේ වෙතත් කියවන්නාව ආකර්ෂණය කර ගැනීම සඳහා අන්තර්ගතය හා නොසැසඳෙන සිරස්තල, කියවන්නාව නොමඟ යවන සුළු සිරස්තල භාවිතා කිරීම ආචාරධර්මානුකූලව නිවැරදි මාධ්‍ය භාවිතාව නොවේ.

ලංකාදීප පුවත්පතේ "වික්ටෝරියා වේල්ලට පැමිණි ත්‍රස්තයන් මරාදමති, මෙහෙයුමට කමාන්ඩෝ භටයෝ 400 ක්" යන හිසින් යුතුව පළ වී ඇති පුවත මෙහිදී අපට ගත හැක. මෙහි සිරස්තලයන්ගෙන් එසේ කියැවුණත්, ලිපියේ අන්තර්ගතයේ කියැවෙන්නේ තෙල්දෙණිය හා වික්ටෝරියා වේල්ල හා ජලාශයන් ත්‍රස්ත ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා දියත් වූ විශේෂ යුද අභ්‍යාසයක් සම්බන්ධයෙනි.

එසේම සිරස්තලයේ කමාන්ඩෝ භටයෝ 400 ක් යනුවෙන් සඳහන් වුවත්, සැබවින්ම අන්තර්ගතයේ සඳහන් වන්නේ යුද, ගුවන, නාවික හමුදා සහ විශේෂ පුහුණුව ලද කොමාන්ඩෝ භටයන් ඇතුළු හමුදා භටයන් 400 ක් මෙයට සහභාගී වූ බවටයි.

මෙහි සිරස්තලය මෙසේ බලනා විට යොදා ඇත්තේ පාඨක ආකර්ෂණය සඳහා යැයි සිතිය හැකි වුවත්, එයින් පාඨකයාව නොමඟ යැමක්ද සිදුනොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?